සමේ වර්ණය පදනම් කරගනිමින් සිදුවන කොන් කිරීම් හා වෙනස් ලෙසින් සැලකීම් ශ්‍රී ලාංකික සමාජය තුළටද ආගන්තුක නොවේ. ඇතැම් විට මාධ්‍ය තුළද දැනුවත්ව හෝ නොදැනුවත්ව සමේ වර්ණය පදනම් කරගනිමින් සිදුවන විශේෂ කොට දැක්වීම්/වෙනස් ලෙසින් සැලකීම් දක්නට ලැබේ. එහිදී විශේෂයෙන්ම කළු හෝ අඳුරු පැහැ සමකට, සුදු හෝ පැහැපත් සමකට වඩා අඩු සැලකිලි ලැබෙනා බවට වෙන අදහසක් වේ.

මෙයට උදාහරණයක් ලෙසින් "ඇයි නාමල් සනත් කළුද?" යනුවෙන් ඉරිදා ලංකාදීප (02/21) පුවත්පතෙහි ලිපියක වන සිරස්තලය දැක්විය හැක. එහිදී ඇඟවෙන අදහස වන්නේ, කළු වීම නිසා අඩු සැලකිල්ලක් ලැබෙන බවක් නොවේද? මෙම ලිපියේ අන්තර්ගතය පමණක් ගත් විට එහි "සනත් කළුද" යන්නෙන් ඔහු සම්බන්ධයෙන් අගතිකාරී අදහසක් ඉදිරිපත් නොවන මුත්, මෙවැනි ලිපියකින් පොදුවේ කළු නිසා අඩු සැලකිල්ලක් ලැබීම සහ සුදු නිසා වැඩි සැලකිල්ලක් ලැබීම වැනි වෙනස් කොට සැලකීමේ අදහස් නැවත නැවතත් ඉස්මතු වනවා නොවේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #SundayLankadeepa